# සංස්කෘතික දියුණුව

විම්පන්සියෙකුව සිට පසුව මිනිසෙකු දක්වා තමන්ගේ ශරීරය සහ මොළය දියුණුකර ගත් මිනිසා දීර්ඝ කාලයක් තිස්සේ තමන් ජීවත්වන ආකාරය වෙනස් කර ගැනීම හැඳින්වෙන්නේ සංස්කෘතික වෙනස්වීම ලෙසය. ඒ අනුව සංස්කෘතික දියුණුව ප්‍රධාන අවධි තුනකට බෙදනු ලැබේ.

1. පුරාශිලා යුගය
2. මධ්‍යශිලා යුගය
3. නවශිලා යුගය

1. පහත සඳහන් කරුණු ප්‍රධාන අවධි තුනට බෙදා යා කර දක්වන්න.

| | |
|---|---|
| 1. පුරාශිලා යුගය | A. කණ්ඩායම් ලෙස තැන තැන ඇවිදිමින් ජීවත් වීම |
| | B. දෙවියන් ඇදහීම |
| | C. මිය ගිය අය වෙනුවෙන් අවමංගල චාරිත්‍ර පැවැත්වීම. |
| | D. දුනු ඊතල භාවිත කිරීම. |
| | E. ගම්මාන බිහි වීම. |
| 2. මධ්‍යශිලා යුගය | F. දැව දඬු හා කොළ අතු බාවිතා කර නිවාස ඉදිකිරීම |
| | G. සතුන් හීලෑකර ගැනීම |
| | H. මීට අවුරුදු 20 000 ක් 18 000ක් අතර පෙර කාලය |
| | I. ගොවිතැනට පුරුදු වීම |
| 3. නවශිලා යුගය | J. ගල් පර්වත මත චිත්‍ර ඇඳීම |
| | K. මීට අවුරුදු 9000 ට පෙර කාලය |
| | L. දඩයම වෙනුවට ගස්වල ගෙඩි කොළ වැඩිපුර ආහාරයට ගැනීම. |